ආදි ශිෂ්‍ය සංගමය - ධර්මපාල විද්‍යාලය, පන්නිපිටිය.
**Past Pupils' Association Dharmapala Vidyalaya, Pannipitiya.**
"Aadi Sisu Sevana" Dharmapala Vidyalaya, Pannipitiya, Sri Lanka.
Tel / Fax : +94 11 2843207 / 0114328966 Mobile : 0717 843207
Email : ppadvp@gmail.com Web : www.dharmapalappa.lk

*Past Pupils' Association - Established in 1947*

2024.03.25

ගරු යාවජීව හා සාමාන්‍ය සාමාජිකත්වය වෙත,

මහත්මයාණෙනි/මහත්මියනි,

## 2024 / 2026 පරිපාලන වාරය සඳහා නව නිලධාරි මණ්ඩලයක් තෝරා පත්කර ගැනීම සඳහා වු නාම යෝජනා කැඳවීමේ නිවේදනය

1. ධර්මපාල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ හැත්තෑ හයවැනි (76) වැනි වාර්ෂික මහා සභා රැස්වීම ***2024 මැයි 05 වෙනි ඉරිදා දින පෙ.ව. 9.00 ට*** විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ පැවැත්වීමට 2024-03-17 වැනි දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ දී බහුතර සාමාජික අනුමැතියෙන් තීරණය විය.

2. තත්කාලීන ව්‍යවස්ථාවේ වගන්ති අංක 22 සිට 24 දක්වා වු නාම යෝජනා සහ නිලවරණ කමිටුව වෙත පැවරි ඇති බලතල අනුව ව්‍යවස්ථාවේ සඳහන් පහත තනතුරු සඳහා නව නිලධාරි මණ්ඩලයක් තෝරාපත් කර ගැනීම සඳහා මින් නාම යෝජනා කැඳවේ.

2.1. ව්‍යවස්ථානුකූල ප්‍රකාරව විධායක සභාවේ නාම යෝජනා කැඳවන තනතුරු පහත පරිදි වේ.

| නිල අංකය | නිලය | තනතුරු ගණන |
|---|---|---|
| 16.1.2 | විධායක සභාපති | 01 |
| 16.1.4 | ප්‍රධාන ලේකම් | 01 |
| 16.1.5 | නියෝජ්‍ය සභාපති | 01 |
| 16.1.6 | නියෝජ්‍ය ලේකම් | 01 |
| 16.1.7 | භාණ්ඩාගාරික | 01 |
| 16.1.8 | උප සභාපති 1 - අධ්‍යාපනික සංවර්ධන හා භෞතික සම්පත් සංවර්ධන | 01 |
| 16.1.9 | උප සභාපති 2 - සාමාජික සුභසාධනය හා සම්බන්ධිකරණ | 01 |
| 16.1.10 | උප සභාපති 3 - සංගමයේ මූල්‍ය උත්පාදනය හා සංචිත ප්‍රවර්ධන | 01 |
| 16.1.11 | උප සභාපති 4 - ක්‍රීඩා සංවර්ධනය හා රාජ්‍ය, පෞද්ගලික සහ අනුබද්ධ ආයතන සම්බන්ධිකරණ | 01 |
| 16.1.12 | නියෝජ්‍ය භාණ්ඩාගාරික | 01 |
| 16.1.13 | ප්‍රචාරක ලේකම් | 01 |
| 16.1.14 | උප ලේකම් | 01 |
| 16.1.15 | නියෝජ්‍ය ප්‍රචාරක ලේකම් | 01 |
| 16.1.16 | විධායක සභිකවරු | 12 |

3. **නාම යෝජනා ඉදිරිපත් කිරීම සඳහා වු පොදු කරුණු**

   i. නාම යෝජනා ඉදිරිපත් කළ හැක්කේ මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුව ඡන්ද බලය හිමි සාමාජිකයින්ට පමණි.- (උපුටා ගැනීම තත්කාලීන ව්‍යවස්ථාවේ වගන්ති අංක 23.2)

   ii. එක් සාමාජියකුට නාමයෝජනා ලබා දිය හැකි වනුයේ තනතුරු 03 ක් සඳහා පමණි.එක් එක් තනතුරු සඳහා වෙන වෙනම නාම යෝජනා අයදුම් පත්‍ර ඉදිරිපත් කළ යුතුය. (උපුටා ගැනීම තත්කාලීන ව්‍යවස්ථාවේ වගන්ති අංක 23.9)

Patrons:

**Maj General T.T.R. De Silva** (Retd.)
RWP RSP VSV USP psc
Dip USAIS, Dip Psy, Dip Counseling,
Former Security Forces Commander (East)
Former Government Agent Trincomalee
Senior Counseller

"Desha Mamaka Sasana Keerthi"
**Rear Admiral Ananda Peiris**
RSP, VSV, USP, ndc, psc, DISS

**Mr. Ranjith Korale**
Chartered MIPM, MIM(SL),
MPMA (UK), Chartered MCPM
HR Management Consultant

**Mr. Sajith De Silva**
FCMI, FDMN, MCIM
C-Suite Corporate Leader,
1st Vice-President, Chartered
Management Institute (UK)
Sri Lanka Branch 2020/21

**Dr. Thusitha Sugatapala**
BSc Eng. Hons (Moratuwa), PhD (Cambridge),
CEng, MIESL, SLEMA (Corporate Member),
SLSTL (Member)

iii. සියලුම නාම යෝජනා පත්‍ර ප්‍රධාන ලේකම් විසින් තත්කාලීන ව්‍යවස්ථාවේ වගන්ති අංක 10.4 ප්‍රකාරව පවත්වාගෙන යනු ලබන සාමාජික ලේඛනය අනුව හා තත්කාලීන ව්‍යවස්ථාවේ වගන්ති අංක 10.5 හි ප්‍රකාරව වලංගු සාමාජිකත්වය හිමි සාමාජිකයින් දෙදෙනෙකුගේ යෝජනා ස්ථිරත්වයෙන් ඉදිරිපත් විය යුතු අතර ඒ සඳහා අපේක්ෂකයාගේ කැමත්ත හා ප්‍රකාශය ලිඛිතව තිබිය යුතුය. නාම යෝජනා පත්‍රය ව්‍යවස්ථාවේ උප ලේඛනය-04ට අනුකූලව ඇති නිල ආකෘති පත්‍රය මගින් නිසි පරිදි ඉදිරිපත් කල යුතුය. (උපුටා ගැනීම තත්කාලීන ව්‍යවස්ථාවේ වගන්ති අංක 23.1)

iv. වාර්ෂික මහා සභා රැස්වීමේදී විධායක සභිකයින් තෝරා පත් කරගන්නා අවස්ථාවේදී අපේක්ෂකයා අනිවාර්යෙන්ම සභා ගැබේ රැඳී සිටිය යුතුය. යම් හෙයකින් නාම යෝජනා ඉදිරිපත් කර ඇති අපේක්ෂකයා සභා රැස්වීමට නොපැමිණෙන්නේ නම් හෝ පැමිණීමට නොහැකි වන්නේ නම් ඒ සඳහා පිළිගත හැකි හේතු නාමයෝජනා හා නිල වරණ කමිටු සභාපතිට ලිඛිතව ඉදිරිපත් කළ යුතුය. ඒ පිළිබඳව අවසාන තීරණය සභාපති සතුය. එම අපේක්ෂකයාගේ නම නිෂ්ප්‍රභා වුවහොත් එම පුරප්පාඩුව පිරවීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති සාමාජිකයකුගෙන් එම පුරප්පාඩුව එකී මහා සභාව විසින් පිරවිය යුතුය. (උපුටා ගැනීම තත්කාලීන ව්‍යවස්ථාවේ වගන්ති අංක 23.7)

v. විධායක සභාපති තනතුර හා ප්‍රධාන ලේකම් තනතුර සඳහා ඉල්ලුම් කරන අපේක්ෂකයින් තමා පිළිබඳ විස්තර වාර්තාවක් (profile) නාම යෝජනා පත්‍රය සමග අමුණා එවිය යුතුය. නිලයට පත්වීමෙන් පසු සංගමයේ සහ පාසලේ අභිවෘද්ධිය වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ව්‍යාපෘති වල සාරාංශ වාර්තාවක් අයදුම්පත සමග ඇමිණිය යුතුය.(උපුටා ගැනීම තත්කාලීන ව්‍යවස්ථාවේ වගන්ති අංක 23.10)

vi. එක් එක් විධායක සභාවක නිල කාලය වසර දෙකකි. සියලුම විධායක සභිකයින්ගේ ධුර කාලය තේරී පත්වූ මහා සභා රැස්වීමෙන් පසුව එළඹෙන දෙවන වාර්ෂික මහා සභා රැස්වීම දක්වා පමණක් වලංගු වේ.(උපුටා ගැනීම තත්කාලීන ව්‍යවස්ථාවේ වගන්ති අංක 16.4.1)

vii. එක් තනතුරු සඳහා අයදුම් කිරීමේදී සැපරිය යුතු සුදුසුකම් හා තනතුරට පත්වීමෙන් පසු සංගමය වෙනුවෙන් දැරිය යුතු වගකීම් තත්කාලීන ව්‍යවස්ථාවේ උපුටා ගත් සාරාංශයක් අයදුම්කරුවන්ගේ දැන ගැනීම පිණිස මෙහි අමුණා ඇත.

## 4. <u>නාම යෝජනා අයදුම් පත්‍ර ලබාගත හැකි ක්‍රම වේදය</u>

සියලු නාම යෝජනා පත්‍ර අනුක්‍රමික අංක යටතේ ලියාපදිංචි කොට ඉල්ලුම්කරුවන් වෙත නිකුත් කිරීමට නාම යෝජනා හා නිලවරණ කමිටුව කටයුතු කර ඇති හෙයින් එසෙ නිකුත් කරන ලද අයදුම් පත්‍ර පමණක් යොමු කල යුතු බව දන්වමු.

i. ආදි ශිෂ්‍ය කාර්යාලයට පැමිණ සාමාජිකත්වය තහවුරු කොට අයදුම්පත් ලබා ගැනීම.
ii. ආදි ශිෂ්‍ය සංගමයේ කාර්යාලීය විද්‍යුත් ලිපිනය වන ppadvp@gmail.com වෙත ඉල්ලීමක් යොමු කිරීමෙන්
iii. ආදි ශිෂ්‍ය සංගමයේ කාර්යාලීය ජංගම දුරකතන අංකය වන 0717-843207 ට WhatsApp පණිවිඩයක් මගින් ඉල්ලීමක් යොමු කිරීමෙන්

**සැ.යු. :** අනුක්‍රමික අංක රහිත ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය නාම යෝජනා සහ නිල වරණ කමිටුව සතු අතර එක් අයදුම්කරුවකු විසින් තනතුරු කීපයකට ඉල්ලුම් කිරීමේ දී වෙන් වෙන් වශයෙන් අනුක්‍රමික අංක සහිත අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

## 5. <u>සම්පූර්ණ කරන ලද නාම යෝජනා අයදුම්පත් ආදි ශිෂ්‍ය සංගමයට භාරදීමේ ක්‍රියා පිළිවෙල</u>

i. සම්පූර්ණ කරන ලද නාම යෝජනා පත්‍රය ආදි ශිෂ්‍ය සංගමයේ නාම යෝජනා හා නිලවරණ කමිටු සභාපති වෙත ලැබෙන සේ **2024/04/15 දින ප.ව 6.00** ට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය හැක. එසේ එවීමේදී ලියුම් කවරයේ වම් පස උඩ කෙලවරෙහි **"2024/2026 වාරය සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරීම"** යනුවෙන් සඳහන් කිරීම කළ යුතු වේ.
ii. සම්පූර්ණ කරන ලද නාම යෝජනා පත්‍ර ආදි ශිෂ්‍ය කාර්යාලයේ තබා ඇති ලේඛනයේ සටහන් කර නාම යෝජනා අයදුම්පත්‍ර බහාලන පෙට්ටියට බහාලීම. රජයේ නිවාඩු දින හැර පෙ.ව 08.30 සිට ප. ව. 5.00 දක්වා කාර්යාලය විවෘතව ඇති අතර නාම යෝජනා පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ දී පමණක් ප.ව 6.00 දක්වා කාර්යාලය විවෘතව ඇත.)

## 6. <u>සම්පූර්ණ කරන ලද නාම යෝජනා අයදුම්පත් භාරගන්නා අවසාන දිනය සහ වේලාව</u>

i. සම්පූර්ණ කරන ලද නාම යෝජනා පත්‍ර භාර ගැනීම <u>**2024 අප්‍රේල් මස 15 වැනි සඳුදා දින ප.ව. 6.00**</u> ට අවසන් වේ.

තනතුරු සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරීමේදී ව්‍යවස්ථාවේ 16 සිට 16.3.12.2 දක්වා සඳහන් සියලු කරුණු සැලකිල්ලට ගත යුතු අතර මෙහි සඳහන් කර ඇත්තේ මූලික ව්‍යවස්ථානුකූල කරුණු පමණක් වන හෙයින් සවිස්තර පැහැදිලි කිරීමක් සඳහා මෙහි සඳහන් QR කේතය Scan කිරීම මගින් හා සංගමයේ නිල වෙබ් අඩවිය වන www.dharmapalappa.com මගින් තත්කාලීන ව්‍යවස්ථාවට පිවිසිය හැකි බව වැඩිදුරටත් දන්වමු.

ස්තුතියි.

මෙයට,

ආචාර්ය ගාමිණි පද්මපෙරුම
නාම යෝජනා හා නිලවරණ කමිටු සභාපති